**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය බදුල්ල**

**පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

**மாவட்ட செயலக காரியாலயம் - பதுளை**

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

District Secretariat – Badulla

Submission of observation of Hon. Minister and steps taken with regards to the reports labled by the Committee on Public Accounts in terms of Standing Order

No.119 (4)

ඇමුණුම 01

**<u>ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග 119 (4) සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.</u>**

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය බදුල්ල.

| **රා.ගි.කා. සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මඟපෙන්වීම** | **ගණන් දීමේ නිලධාරී විසින් ගත් ක්‍රියාමාර්ග** | **වර්තමාන ප්‍රගතිය** |
|---|---|---|
| විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | පිළිගනිමි. කාර්තුවකට වරක් පවත්වන සෑම විගණන කළමණාකරණ කමිටු රැස්වීමේ දී ම මේ සම්බන්ධයෙන් දැනුවත් කරන අතර, ප්‍රගති සමාලෝචනය සිදු කරයි.<br>ප්‍රමාදය වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.විගණන විමසුම් වලට පිළිතුරු නියමිත දිනට නිවැරදිව ලබාදෙන ලෙස සියළුම ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇත. | ඉදිරියේ දී ප්‍රමාදය වළක්වාගෙන 100% ප්‍රගතියක් ලබා ගැනීමට බලාපොරොත්තු වෙමි. |
| 2016.03.31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2016.03.31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට වාර්තා ඉදිරිපත් කළ යුතු බවට අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී. | 2020 වර්ෂයේ සිට භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත කාලයට සිදු කර ඇත. |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | පිළිගනිමි. ඒ සඳහා අවශ්‍ය අභ්‍යන්තර පාලන පද්ධතිය විධිමත් කර ඇත. ව්‍යාකූලව තිබූ බඩු වට්ටෝරු පොත් නිවැරදිව පවත්වාගෙන යාමට අවශ්‍ය වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත. අතිරික්ත ,ඌනතා හදුනා ගැනීමේ ගැටළුවක් පවතින බැවින් නිවරදි කර ගැනීමට හැකි වන පරිදි භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | 2023 වර්ෂයේ එම අතිරික්ත ඌනතා නිවැරදිව හඳුනාගෙන නිර්දේශ නියමිත කාල වකවානුව තුල සිදු කිරීමට අවශ්‍ය විධිවිධාන යොදා ඇත. |
| සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා නියමිත කාලයට විගණකාධිපති වෙත යොමු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී. | මේ වන විට ප්‍රගතිය 90% වේ. |
| වාහනයක් ගර්භිත වී මාස 6 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි. | මෙම වාහන වසර 13කටත් වඩා පැරණි වාහන වන අතර , ඒවායේ කිසිදු කටයුත්තක් 2018 වර්ෂය වන තෙක්ම සිදු වී නොමැති අතර, එම ප්‍රමාදය නිසාම වගකිවයුතු නිලධාරීන් මියයාම, ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනීමේ දී ඇති වූ නීතිමය ගැටළු, තක්සේරු කිරීමේ ගැටළු, ලියකියවිලි අස්ථානගතවීම්, එම රිය අනතුරු සම්බන්ධයෙන් නඩු කටයුතු තිබීම හා මූලික පරීක්ෂණ වාර්තා නොතිබීම යන ගැටළු හේතුවෙන් ඒවායේ අපහරණයට | මේ වන විට අපහරණ කටයුතු 75% ක් පමණ අවසන් වී ඇත. |

| | | |
|---|---|---|
| | අදාල කටයුතු කඩිනමින් සිදුකිරීමේ ප්‍රායෝගික ගැටළු කිහිපයකට මුහුණ දීමට සිදුවිය. එම ගැටළු විසඳා ගනිමින් අපහරණ කටයුතු කඩිනමින් කිරීමට උපදෙස් ලබා දී ඇත. | |
| 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහන වල ඉන්ධන දහනය වීම පිලිබඳව පරීක්ෂා කර නොතිබුණි. | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාල චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත.<br>2022.06.08 දින පැවති විගණන කළමනාකරණ කමිටු තීරණය පරිදි මගේ අංක BD/EHM/06/03/20 හා 2022.07.19 දිනැති ලිපිය මගින් චක්‍ර ලේඛයේ විධිවිධාන වලට අනුව ඒ හා සම්බන්ධ තාක්ෂණික දැනුම ඇති නිලධාරීන් යොදවා ගනිමින් පරීක්ෂා කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | මේ වන විට ප්‍රගතිය 90% පමණ වේ. |
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | මෙම හිඟ ණය ශේෂ වලින් පළාත් සභා නිලධාරීන්ට අදාල ණය ශේෂ නිරවුල් කිරීම සම්බන්ධයෙන් පළාත් සභාව දැනුවත් කර ඇත.<br>ඊට අමතරව මෙම හිඟ ණය ශේෂ තුල ඇතුලත් මෙරු. 80,300.00ක ණය ශේෂය නිවැරදි කිරීමට තරම් ප්‍රමාණවත් තොරතුරු තව දුරටත් සෙවිය යුතු බැවින්, මේ වන විට භාණ්ඩාගාරය වෙතින් 2007 වර්ෂයට අදාල භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත පිටපත් ලබාදෙන මෙන් ඉල්ලුම් කර ඇති බව දන්වා සිටිමි. | අනෙකුත් ණය ශේෂ වාරික වශයෙන් අයකර ගැනීමේ කටයුතු සිදුවන අතර පළාත් සභා ණය ශේෂය තුල රු. 167,281.00ක මුදලකට අදාලව ණය ශේෂ නිරවුල් කරගෙන ඇත. |
| පොදු තැන්පත් ගිණුමේ කල ඉකුත් වූ තැන්පතු තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් විගණන කළමණාකරණ කමිටු රැස්වීම් වලදී දැනුවත් කර ඇත.<br>මු.රෙ. 157 ප්‍රකාරව කටයුතු කිරීමට අදාලව 2017.06.30 දින විගණන කළමනාකරණ කමිටුවේ තීරණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කර ඇත. | මේ වන විට 100% ක ප්‍රගතියක් ඇත. |
| ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි. | පිළිගනිමි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල මෙය ක්‍රියාත්මක කරන ලෙස දැනුම් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙබ් අඩවිය තුළ 2022.05.13 දින සිට මේ සඳහා පහසුකම් සපයා ඇත. |
| 2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරන තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ චක්‍රලේඛ විධිවිධාන අනුව ඉටු කළ යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා | චක්‍රලේඛ විධිවිධාන අනුව තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සිදු කරන ලදී. | 2020 වර්ෂයේ සිට සම්බන්ධීකරණය සඳහා පත්කල යුතු නියෝජිතයන් දෙදෙනා පිළිබඳව විස්තර තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය වෙත වාර්තා කරන ලදී. |

| | | |
|---|---|---|
| පත්කල යුතු නියෝජිතයන් දෙදෙනා පිළිබඳව විස්තර තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි. | | |
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | පිළිගනිමි. 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ විධිවිධාන අනුව මානව සම්පත් සැලැස්මක් පිළියෙල කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | 2020 වර්ෂයේ සිට 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ විධිවිධාන අනුව මානව සම්පත් සැලැස්මක් පිළියෙල කිරීම සිදුකර ඇත. |
| සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | මෙ සම්බන්ධයෙන් පුහුණු වැඩසටහනක් ඉල්ලා ඇත. | 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙමි. |

දමයන්ති පරණගම,
දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
බදුල්ල.

DAMAYANTHI PARANAGAMA
Government Agent/District Secretary
Badulla.

ඩබ්.ඒ. අරුණ ශාන්තප්‍රිය,
ප්‍රධාන ගණකාධිකාරී,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
බදුල්ල.

W.A. Aruna Shanthapriya
Chief Accountant
For District Secretary, Badulla

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

නිල් බණ්ඩාර හපුහින්න
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

නිල් බණ්ඩාර හපුහින්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය
ස්වදේශ කටයුතු අංශය

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග මගින් 2023 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ලඟාකර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)
අග්‍රාමාත්‍යතුමා සහ
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍ය.